# රාජ්‍ය සේවා කොමිෂන් සභාව - උතුරු මැද පළාත

## උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ උපස්ථායක / උපස්ථායිකා
## III ශ්‍රේණියේ තනතුර සඳහා පුහුණුවට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018

උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී පවතින උපස්ථායක / උපස්ථායිකා III ශ්‍රේණියේ තනතුරේ පුහුණුවට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා උතුරු මැද පළාත තුළ පදිංචි ස්ත්‍රී / පුරුෂ දෙපාර්ශවයෙන්ම 2018.06.28 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2018 අගෝස්තු මසදී අනුරාධපුර නගරයේදී පැවැත්වීමට නියමිත වේ.

**02. පුරප්පාඩු සංඛ්‍යාව :** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පවත්නා පුරප්පාඩු ගණනට අනුව හෝ අදාළ පරිදි බඳවා ගැනීම පිළිබඳ අවසන් තීරණය උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

**03. සුදුසුකම් :**

අයදුම්කරුවන් අයදුම්පත් කැඳවන අවසාන දිනට පහත සඳහන් සියලුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**I. පොදු සුදුසුකම්**

i. අයදුම්පත් කැඳවන අවසාන දිනට උතුරු මැද පළාත තුළ අවම වශයෙන් අවුරුදු 03 ක ස්ථිර පදිංචිය ඇති ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

ii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.

iii. **වයස් සීමාව :** අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු. 18 ට නොඅඩු අවු. 45 ට නොවැඩි විය යුතුය.

**II. අධ්‍යාපන සුදුසුකම් :**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (2) සහිතව විෂයන් හයක් සමත් වී තිබීම.

**III. කායික සුදුසුකම් :**

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**IV. වෘත්තීය සුදුසුකම් :**

තනතුරට අදාළව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය 2 හෝ 3 වන මට්ටටමට නොඅඩු මට්ටමක (NVQ 2 හෝ NVQ 3) ලබා තිබීම.

**සටහන :** ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ 2 හෝ NVQ 3) සහිත ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවලදී අධ්‍යාපන සුදුසුකම් පමණක් සහිත අයදුම්කරුවන් අතරින් ලිඛිත විභාගයේදී ලැබූ කුසලතා අනුපිළිවෙළ අනුව තනතුරු සඳහා බඳවා ගනු ලැබේ.

**V. පළපුරුද්ද** – අදාළ නොවේ

**04. බඳවා ගැනීමේ ක්‍රමය :**

ලිඛිත විභාගයේ ප්‍රතිඵල පදනම් කරගනිමින් කුසලතා අනුපිළිවෙළ මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/90 අනුව දිස්ත්‍රික් ජනගහන අනුපාත ක්‍රමය පදනම් කර ගනිමින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

**සටහන :** තෝරාගනු ලබන පත්වීම්ලාභී සේවක සේවිකාවන්ට තුන්මසක සේවාරම්භක පුහුණුවක් ලබාදෙනු ලැබේ. පුහුණු කාලය තුළ විභාග වලින් අසමත් වන්නා වූ හෝ පුහුණු ආයතනයේ විනය, නිවාඩු පිළිබඳ නීති නොපිළිපදින්නා වූ හෝ සේවක සේවිකාවන්ගේ පත්වීම් අහෝසි කරනු ලැබේ.

**05. වැටුප් ක්‍රමය :** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 ට අනුව වැටුප් කේත අංක PL 02-2016 යටතේ වැටුප් පරිමාණය රු. 25,250-10x270-10x300-10x330-12x350-38,450/- වේ. එම චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ. මීට අමතරව රජයේ අනුමත ජීවන වියදම් දීමනාව හා වෙනත් අදාළ දීමනාද මාසිකව ගෙවනු ලැබේ.

**06. ඉල්ලුම් කළ යුතු ක්‍රමය :**

I. මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව, අයදුම් පත්‍රයේ අංක 01 සිට 5 (I) තෙක් වූ ශීර්ෂ පළමුවන පිටුවටද, ඉතිරිය ඊළඟ පිටුවලටද ඇතුළත් වන රිදී සෙ.මී. 21x29 (ඒ4 ප්‍රමාණයේ) කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් ඉල්ලුම්පත සකස් කළ යුතුය. ඉල්ලුම්පත බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "**උපස්ථායක / උපස්ථායිකා (III ශ්‍රේණිය) තනතුර සඳහා පුහුණුවට බඳවා ගැනීම – 2018**" යනුවෙන් සඳහන් කර 2018/06/28 **දින හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය, අනුරාධපුර"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (පෞද්ගලික නමකට හෝ වෙනත් කිසිදු ලිපිනයකට හේ නොඑවිය යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත)

II. නියමිත ආකෘතියට අනුකූලව සකස් නොකල, අසම්පූර්ණ, නියමිත විභාග ගාස්තු නොගෙවූ හෝ ප්‍රමාද වී හෝ ලැබෙන ඉල්ලුම්පත් තැවත දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

III. තැපෑලේදී අස්ථාන ගතවන ඉල්ලුම්පත් පිළිබඳව කෙරෙන කිසිදු පැමිණිල්ලකට මෙම කොමිෂන් සභාව වග කියනු නොලැබේ.

IV. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් ස්වකීය ඉල්ලුම්පත තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු වන අතර, සුදුස්සකු වශයෙන් තේරී පත්වුවහොත් එම දෙපාර්තමේන්තුවෙන් නිදහස් කිරීමට එකග වන බවට සහතික කරවාගත යුතුය.

V. මෙම නිවේදනයේ දැක්වෙන නියමයන්ට අනුකූල නොවන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

VI. ඉල්ලුම්පත ලද බව දන්වනු නොලැබේ.

මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් සඳහා පමණක් තරග විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ. එබැවින් සෑම අයදුම්කරුවකු විසින්ම අයදුම්පත්‍රයේ අදාළ තැන්හි ඉතා පැහැදිලිව තම සුදුසුකම් සඳහන් කළ යුතුය. පැහැදිලිව තොරතුරු ඇතුළත් නොකිරීමෙන් ඇතිවිය හැකි ගැටළු සඳහා මෙම කොමිෂන් සභාව වග කියනු නොලැබේ. තරග විභාගය සඳහා ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට වූ පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ. (කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත)

**07. විභාග ගාස්තු :**

සෑම අයදුම්කරුවෙකුම රු. 600/- ක විභාග ගාස්තුවක් ගෙවිය යුතුය. එම විභාග ගාස්තුව උතුරු මැද පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ඒ සඳහා නිකුත් කරන එන්සී 100 දරන කුවිතාන්සිය අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය. එම විභාග ගාස්තුව ගෙවිය යුත්තේ උතුරු මැද පළාත් පොදු තැන්පත් ගිණුමට බැරවන ලෙසය. අයකර ගනු ලබන විභාග ගාස්තුව කිසිම හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ.

**08. විභාගයට ඇතුළත් වීම :**

I. උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පිළිගත් සියලුම අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගය පවත්වන දිනට **දින 7 කට ප්‍රථම** තම ප්‍රවේශපත්‍ර නොලැබුන අපේක්ෂකයින් වෙතොත් ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු මැද පළාත වෙතින් ඒ පිළිබඳව විමසිය යුතුය. ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී, විභාග ශාලාධිපති වෙත තම අනන්‍යතාව ඔප්පු කළ යුතු අතර, ඒ සඳහා පිළිගනු ලබන්නේ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පමණි. මෙම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන සියලුම නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් විය යුතුය. එම නීතිරීති උල්ලංඝනය කළ හොත් උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

II. **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :**

අපේක්ෂකයන් තම අත්සන ග්‍රාම නිලධාරි / රජයේ විදුහල්පතිවරයෙකු හෝ සාමදාන විනිශ්වයකාරවරයකු / දිවුරුම් කොමසාරිස්වරයකු / නීතිඥවරයකු / ත්‍රිවිධ හමුදාවේ බලයලත් නිලධාරියකු හෝ පොලිස් සේවයේ හෝ ගැසට් කරන ලද තනතුරක් දරන නිලධාරියකු හෝ වර්ෂයකට රු. 240,360/- කට නොඅඩු ඒකාබද්ධ වාර්ෂික වැටුපක් ලබන රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියකු විසින් සහතික කරනු ලැබිය යුතුය.

**09. අයදුම්කරු විසින් පහත සඳහන් ලිපි ලේඛන සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කළ අවස්ථාවක ඉදිරිපත් කළ යුතුය.**

I. උප්පැන්න සහතිකය

II. අධ්‍යාපන සුදුසුකම් වලට අදාළ සහතික

III. පදිංචිය තහවුරු කිරීම සඳහා ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලදුව ප්‍රාදේශිය ලේකම් විසින් අනු අත්සන් කරනලද පදිංචි සහතිකය (DS4 ආකෘතිය මගින් සනාථ කළ යුතුය)

IV. වෙනත් චරිත සහතිකයක්

V. වෙනත් සුදුසුකම් සඳහා වූ අදාළ සහතික

**සැළකිය යුතුයි : ලියකියවිලි / සහතික හෝ ඒවායේ පිටපත් ඉල්ලුම් පත්‍රය සමග එවීම නොකළ යුතුය.**

10. **I. විභාග ක්‍රමය**

උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ මෙම කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වලින් පවත්වනු ලැබේ. ඉල්ලුම්පත් සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙනි.

**සැ. යු. :** අදාළ මාධ්‍ය වලින් අපේක්ෂකයන් ඉදිරිපත් වී නොමැති නම් එකී මාධ්‍යයෙන් විභාගය නොපැවැත්වේ.

**II. ලිඛිත විභාගය**

| විෂයයන් | කාලය | උපරිම ලකුණු | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| විෂයානුබද්ධ දැනුම | පැය 01 1/2 | 100 | 40% |

✷ විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය |
|---|---|
| විෂයානුබද්ධ දැනුම | තනතුරට අදාළ රාජකාරි පිළිබඳ දැනුම, උපකරණ භාවිතය වෘත්තීයේදී කාර්මික ආරක්ෂාව හා වෘත්තීය දැනුම |

✷ විභාගය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

11. **සේවා කොන්දේසි :**

- මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුය. පත්වීම කලින් අවසන් කරනු නොලැබුවහොත් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් විය යුතුය. තවද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන, උතුරු මැද පළාත් විනය කාර්ය සංග්‍රහයේ විධිවිධාන, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, පළාත් මූල්‍ය රීති, දෙපාර්තමේන්තු නියෝග, රජය හා පළාත් සභාව විසින් කලින් කලට පනවනු ලබන නියමයන් හා රෙගුලාසිවලට ද යටත් විය යුතුය.
- බඳවා ගනු ලබන පත්වීම් ලාභීන් අනුමත බඳවා ගැනීම් පරිපාටියේ විධිවිධානයන්ට යටත් වේ.
- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 1/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

12. විශේෂ කරුණු : කුසලතා අනුපිළිවෙලේ ප්‍රමුඛතාවයට අනුව සේවා අවශ්‍යතාවය සැළකිල්ලට ගෙන, පුරප්පාඩු සේවා ස්ථාන වෙත පත්කිරීම් සිදුකරනු ලැබේ. මෙම නිවේදනයේ සඳහන් කරුණු හා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි වනු ඇත.

මෙම පුවත්පත් නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳ තීරණය කිරීමේ අයිතිය ද කිසියම් පුරප්පාඩු වලින් කොටසක් හෝ මුළුමනින්ම හෝ පිරවීම හෝ නොපිරවීම හෝ පිළිබඳ අවසන් තීරණය ගැනීමේ අයිතිය ද උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වන්නේය.

**ලේකම්,**
**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,**
**උතුරු මැද පළාත.**
**2018.05.28**

---

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

## උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ, උපස්ථායක / උපස්ථායිකා III ශ්‍රේණියේ තනතුර සඳහා පුහුණුවට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2018

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය : ☐
සිංහල - 1,
දෙමළ - 2,
ඉංග්‍රීසි - 3,
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. a. අයදුම්කරුගේ මුල්අකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : උදා : SILVA.A.D.
Mr./Mrs./Miss ..........
b. සම්පූර්ණ නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..........
..........
c. සම්පූර්ණ නම : (සිංහලෙන් / දෙමළෙන්) ..........
..........

02. i. ස්ථිර ලිපිනය : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..........
..........
ii. ස්ථිර ලිපිනය : (සිංහලෙන් / දෙමළෙන්) ..........
..........
iii. පදිංචි දිස්ත්‍රික්කය ..........
iv. දුරකථන අංකය : ස්ථාවර : .......... ජංගම : ..........
v.. විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..........
..........

03. උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐
i. ජාතික හැඳුනුම්පත් අංකය ☐☐☐☐☐☐☐☐☐☐☐☐
ii. ස්ත්‍රී / පුරුෂ භාවය ☐
iii. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු ☐☐ මාස ☐☐ දිනය ☐☐

04. ශ්‍රී ලාංකික පුරවැසියෙකු ද යන වග : ඔව් ☐ නැත ☐ (අදාළ කොටුව තුළ ✓ ලකුණ ඇතුළත් කරන්න)

05. අධ්‍යාපන සුදුසුකම් : (අදාළ සහතික ඇමිණිය යුතුය)

(i) අ.පො.ස. (සා.පෙළ) විභාගය : විභාග අංකය : .......... වර්ෂය : ..........

| | විෂයය | සාමාර්ථය | | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|---|---|
| 01 | | | 06 | | |
| 02 | | | 07 | | |
| 03 | | | 08 | | |
| 04 | | | 09 | | |
| 05 | | | 10 | | |

(ii) අ.පො.ස. (උ.පෙළ) විභාගය : විභාග අංකය : .......... වර්ෂය : ..........

| | විෂයය | සාමාර්ථය | | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|---|---|
| 01 | | | 03 | | |
| 02 | | | 04 | | |

(iii) වෘත්තීය සුදුසුකම් (තනතුරට අදාළව) : ඇත ☐ නැත ☐ (අදාළ කොටුව තුළ ✓ ලකුණ ඇතුළත් කරන්න)
අදාළ විස්තර සඳහන් කරන්න ..........

06. ඔබ කවරදා හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී තිබේද ? ඔව් ☐ නැත ☐
(අදාළ කොටුව තුළ ✓ ලකුණු ඇතුළත් කරන්න)

ඔව් නම් විස්තර සපයන්න ..........

07. **අයදුම්කරුගේ සහතිකය :**

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ලදුපත මෙහි අලවා ඇති බවත් මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් යම් කිසි විස්තරයක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව හෝ සොයාගනු ලැබුවහොත් එසේ සොයාගන්නා ලද්දේ තෝරා ගැනීමට පෙර නම් මෙම අයදුම්පත අවලංගු වන බවද, තෝරාගැනීමෙන් පසුව නම් යම් කිසි වන්දියක් නොමැතිව මම සේවයෙන් පහ කරනු ලබන බවද, පිළිගනිමි.

| මුදල් ගෙවන ලද ලදුපත මෙහි අලවන්න. එහි ඡායා පිටපතක් ළඟ තබාගන්න |
|---|

දිනය : .......... අයදුම්කරුගේ අත්සන

08. **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .......... මයා / මිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු / ඇය .......... දින මා ඉදිරිපිටදී ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බවත්, මම සහතික කරමි.

..........
(දිනය, (සහතික කරන්නාගේ අත්සන)
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම : ..........
තනතුර : ..........
ලිපිනය : .......... (නිල මුද්‍රාව තබා සනාථ කළ යුතුයි)

09. දැනටමත් රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල සේවය කරන නිලධාරීන් සඳහා පමණක් අදාළ වේ.
දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම අයදුම්පත ඉදිරිපත් කර ඇති .......... මයා / මිය / මෙය .......... දෙපාර්තමේන්තුවේ / ආයතනයේ .......... දින සිට .......... දින දක්වා .......... වශයෙන් සේවය කරන අතර, ඔහුට / ඇයට එරෙහිව නොනිමි විනය චෝදනා වාර්තා වී ඇත. / නැත. ඔහුගේ / ඇයගේ වැඩ හැසිරීම හා පැමිණීම සතුටුදායක / අසතුටුදායකය. නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ඔහු / ඇය .......... තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් මෙම දෙපාර්තමේන්තුවෙන් / ආයතනයෙන් මුදා හැරීමට හැකි / නොහැකි බව දන්වනු කැමැත්තෙමි.

..........
(දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ අත්සන)